# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/61 - 2021 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා - 2021.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මියයාම හේතුකොට ගෙන අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ තනතුර දරූ සභාපති වන මඩපුලි මුහන්දිරම්ලාගේ සන්ධ්‍යා කුමාර අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ගම්ලත්රාලලාගේ පද්මා කුමාරි වැත්තැව නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

අලව්ව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ගම්ලත්රාලලාගේ පද්මා කුමාරි වැත්තැව, අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්. එම්. එච්. බී. රත්නායක,<br>
තේරීම්භාර නිලධාරී,<br>
අලව්ව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
කුරුණෑගල.

11 - 258